**විශ්වීය සමාජ ආරක්ෂණය: දැන් නොවේ නම්, කවදාද?**

2022 ජූනි 28 වන අඟහරුවාදා



**සමාජ ආරක්ෂාව යනු හිමිකමක් වන අතර එය තෝරා බේරා ගත යුතු පුණ්‍යායතනයක් ලෙස හෝ විනය යාන්ත්‍රණයක් ලෙස නොසැලකිය යුතුයි - ඡායාරූපය ෂෙහාන් ගුණසේකර**

ආර්ථික යුක්තිය සඳහා වන ස්ත්‍රීවාදී එකමුතුව විසිනි.

**භයානක තත්ත්වය**

ශ්‍රී ලංකාවේ මානුෂීය අර්බුදය, මූලික ආහාර සහ ඖෂධ ලබා ගැනීම සඳහා මිනිසුන් දිනපතා කරන අරගල තුළ දෘශ්‍යමාන වේ. දින කිහිපයකට පෙර, එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලංකාවට මානුෂීය ආධාර ඉල්ලා සිටියේ, කුටුම්භවලින් 70% ක් ආහාර ගැනීමෙන් වැළකී සිටින බව හෝ ඔවුන්ගේ ආහාර පරිභෝජනය අඩු කර ඇති බව සඳහන් කරමිනි. පසුගිය වසර දෙක තුළ ආහාර මිල ගණන් 73% කින් ඉහළ ගිය අතර දේශීය නිෂ්පාදනය විශාල ලෙස පහත් වැටුණි. වේදනාකාරී ආර්ථික දුෂ්කරතාවල ආතතිය හේතුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත්

ප්‍රචණ්ඩත්වය සහ ළමා ආරක්ෂාව පිළිබඳ වැඩි සැලකිල්ලක් ද සටහන් වී ඇත. තවද, එක්සත් ජාතීනගේ ළමා අරමුදල (UNICEF) අවධාරණය කළේ ළමයින් 2 කුගෙන් 1අයෙකුට මානුෂීය ආධාර අවශ්‍ය වන බවයි.

පැවැත්ම සඳහා වන අරගල පිළිබඳ හද කම්පා කරවන කතා දිනෙන් දින වැඩි වන අතර, මිල පාලනය සහ බෙදාහැරීමේ ක්‍රමය හරහා ක්ෂණික අවශ්‍යතා සඳහා ආමන්ත්‍රණය කිරීමට රජය දක්වන උදාසීනත්වය මිනිසුන්ගේ බලාපොරොත්තු සුන්වීමේ හැඟීම් වැඩි කර ඇත. ඉන්ධන පෝලිම් වල සිටින පිරිසට ජීව උණ්ඩ යොදා ගනිමින් රඹුක්කන ප්‍රදේශයේදී එක් අයෙකු ඝාතනය කරන සහ විශ්වමඩු ප්‍රදේශයේදී පුද්ගලයින් දෙදෙනෙකුට තුවාල සිදු කරන අයුරු අපි පසුගියදා දුටුවෙමු . රාජ්‍යය ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම නිසා, කාන්තාවන්ට දුෂ්කර තේරීම් කිරීමට සිදු වී ඇත. ඒ, තම ආහාර වේලෙහි බිත්තරයක් අනුභව කරන්නේ හෝ පාසල් යන්නේ කුමන දරුවා ද , උසස් අධ්‍යාපනය අත්හැරීම හෝ වෘත්තීය පුහුණුව වෙත යොමුවී ගෘහ ආදායමට අතිරේක රැකියාවක් සොයා ගැනීම හෝ ගමන්වියදම සහ නවාතැන් දැරිය නොහැකි නිසා තිබෙන රැකියාව නතර කිරීම වැනි ඒවාය.

සාගතයක් අත ළඟය. එහෙත්, නාගරික දුප්පතුන්ට, ග්‍රාමීය අවිධිමත් අංශයේ, වතුකරයේ සහ කම්හල්වල කම්කරුවන්ට සහ වැටුප් නොලබන වැඩ කරන අයට අර්බුදය විසින් ඇති කර ඇති දරුණුතම කොන්දේසිවලින් ඈත් ව සිටින ප්‍රභූන් අතර යථාර්ථය පිළිබඳ විකෘති සංකල්ප දිගටම සංසරණය වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ දුප්පතුන්ගෙන් 80%ක් ග්‍රාමීය අංශයේ ජීවත් වෙති. කෙසේ වෙතත්, මිනිසුන්ට දිවි ගලවා ගැනීම සඳහා කොස් සහ කැඳ ආහාරයට ගත හැකි බවට කරන රොමැන්තිකකරණය කළ ප්‍රකාශයන් තුළින් විශාල ග්‍රාමීය ජනගහනය, ඔවුන්ගේ ජීවිතය ගෙවන ආකාරය සහ මෙම කුඩා දිවයිනේ අසමානතාවය පවත්වා ගෙන යන ව්‍යුහයන් පිළිබඳ නොදැනුවත්කම සංඥා කරයි .

සමාජ ආරක්ෂණයේ අරමුණ: එදා සහ අද

කොවිඩ්-19 වසංගතය හා ආර්ථික අර්බුදය විසින් ඇති කර හදිසි ආදායම් අහිමිවීමේ අහිතකර ප්‍රතිවිපාකවලින් ජනතාව මුදවා ගැනීමේ සමාජ ආරක්ෂණ වැඩසටහන්වල වැදගත්කම හෙළිදරව් කර ඇත. ආදායම් ඉපැයීමේ හැකියාව මත මහලු විය, අසනීප තත්ත්වයන්, මාතෘත්වය, විරැකියාව, ආබාධිතභාවය, වෘත්තීය අනතුරු සහ රෝග වැනි හේතු බලපෑම් ඇති කරයි. මේ අනුව, සමාජ ආරක්ෂණය මානව අයිතිවාසිකමක් ලෙස පිළිගැනේ. විශ්වීය සමාජ ආරක්ෂණය යනු ස්ත්‍රීවාදීන්ගේ දිගුකාලීන ඉල්ලීමක් වන අතර, ඒ කාන්තාවන් අවිනිශ්චිත තත්වයන් යටතේ වැඩ කිරීමට පෙලඹීමත් සමාජ ප්‍රතිනිෂ්පාදනයේදී කාන්තාවන්ගේ නොගෙවූ ශ්‍රමයට වන්දි හෝ අගයක් නොලැබෙන හෙයිනි. කෙසේ වෙතත්, ආර්ථික අර්බුදය පිළිබඳ මෑතකාලීන සාකච්ඡා වලදී, සමාජ ආරක්ෂණයේ දැක්ම සහ විෂය පථය විකෘති කර ඇත - එය ජීවිතාරක්ෂක සහ ආර්ථික ප්‍රකෘති උත්තේජක ක්‍රියාමාර්ගයකට ප්‍රතිවිරුද්ධ වූ දීමනාවක් දක්වා අඩු කර ඇත.

ඓතිහාසික වශයෙන්, ශ්‍රී ලංකාව පුළුල් සමාජ සුබසාධන ක්‍රමයක් භුක්ති විඳියි. විශ්වීය නිදහස් සෞඛ්‍ය සහ අධ්‍යාපනය සැපයීම ශ්‍රී ලංකාවේ නිදහසින් පසු සංවර්ධනයේ කුළුණු දෙක වන අතර එය ඉහළ මානව සංවර්ධන දර්ශකයට (දකුණු ආසියාවේ ඉහළම සහ ගෝලීය වශයෙන් රටවල් 189 න් 72 හි ස්ථානගත වී ඇත) දායක වේ. රාජ්‍ය අංශය සඳහා මහලු වියේ දී ලැබෙන විශ්‍රාම වැටුප් සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ද පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල හරහා ද විශ්‍රාම ප්‍රතිලාභ ලබාදේ. ගොවීන් සහ ධීවරයින් ඇතුළු අවිධිමත් ආර්ථිකයේ කම්කරුවන් සඳහා ස්වේච්ඡා දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, ප්‍රමාණවත් නොවන නමුත් ලබා ගත හැකිය. මීට අමතරව, මෙම යෝජනා ක්‍රම මගින් ආබාධිත සහ සෞඛ්‍ය සේවා

සහ දුප්පතුන් ඉලක්ක කරගත් සමෘද්ධි යෝජනා ක්‍රමයන් ද ආවරණය කරයි . දශක ගණනාවක් තිස්සේ මෙම වැඩසටහන්වල අරමුදල් ක්‍රමානුකූලව අඩුවෙමින් සහ දුර්වල වෙමින් ඇත.

නව ලිබරල් චින්තකයින් තර්ක කරන්නේ 'වඩාත් අවදානමට ලක්විය හැකි' කොටස් ඉලක්ක කරගත් සමාජ ආරක්ෂණ ජාලයක් තුළින් දැඩි අරපිරිමැස්ම සඳහා ගන්නා පියවරවල වේදනාකාරී ප්‍රතිවිපාක අවම කළ හැකි බවයි. අපගේ පෙර ප්‍රකාශය, දැඩි අරපිරිමැස්ම සඳහා ගන්නා කප්පාදුව , “ඵලදායිතාවයේ වැඩිදියුණු කිරීම් වලක්වාලන අතර ශක්තිමත් සමාජ යටිතල ව්‍යුහය සමඟින් අන්තර්ගත ආර්ථික වර්ධනය වළක්වන” බව අවධාරණය කළේය. මිනිසුන්ගේ ජීවනෝපායන් කෙරෙහි සිදුවන කප්පාදුවේ ගැඹුරු බලපෑම්වලට කෙසේ හෝ වන්දි ගෙවීමට ආරක්ෂිත දැල්වලට හැකි බව ප්‍රකාශ කිරීම නොමඟ යවන සුළුය. නිදසුනක් වශයෙන්, ගොවීන් හට පොහොර සහනාධාර ඉවත් කිරීම තුළින්,1000% කින් විශාල ලෙස ඉහළ ගොස් ඇති මිල දරා ගැනීමට නොහැකි වන අතර ගොවිතැන අත්හැරීමට ද බල කෙරෙනු ඇත.

ඉන්ධන හිඟය හේතුවෙන් ධීවර ජනතාවට මාස දෙකක උපයන ආදායමක් අහිමි වී තිබේ. මේ වසරේ භූමිතෙල් මිල වැඩිවීම නිසා කුඩා ධීවර බෝට්ටුවක් මුහුදට ගෙනයාමේ වියදම රු. 6,000 සිට රු. 8,000 දක්වා ඉහළ ගොස් ඇත. මෙම සන්දර්භය තුළ, ඉලක්කගත සමාජ ආරක්ෂණ පියවරයන් ලෙස මාසික ලබා දෙන යෝජිත රු.3,000 සිට රු 7,000 දක්වා වන මුදලින් වෙනසක් සිදුවන්නේ නැත. ඔවුන්ගේ ජීවනෝපාය සහ ජාතික ආහාර සැපයුම් දාම දැඩි අරපිරිමැස්ම සඳහා ගන්නා කප්පාදු පියවරයන් විසින් විනාශ කර ඇත.

සමෘද්ධිය හරහා සපයනු ලබන මුදල් මාරු කිරීම් අවදානම් සහගත ලෙස අඩු හෝ ආදායම් නොමැති අය සඳහා වැදගත් වෙනසක් සිදු කරයි. පවුල් ජීවිතය පවත්වාගෙන යාම මෙම සොච්චම් දායකත්වය මත රඳා පවතී. සමෘද්ධිය හරහා ඉතුරුම් ක්‍රමයක් සහ කුඩා ණය වැඩසටහනක් සපයයි. සමෘද්ධි ණය යෝජනා ක්‍රමය 8% සිට 10% දක්වා පොළී අනුපාතයක් සහිතව පුළුල් කිරීමට පසුගිය වසරවල රජයන් අවධානය යොමු කළේය .මෙම ඉතුරුම් ජන ජීවිතයට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලිභාවයේ සාමාන්‍ය අඩුවක් තිබේ. මීට අමතරව සමෘද්ධි ඉතුරුම් අරමුදලේ අයථා පරිහරණය, දූෂණ හා වංචා පිළිබඳ විමර්ශන වසර ගණනාවක් තිස්සේ වාර්තා වී ඇත. තරුණ සාමාජිකයින් බොහෝ දෙනෙකු මුදල් හුවමාරු ප්‍රතිලාභවලින් බැහැර කර ඇති අතර ඔවුන් සමෘද්ධි ණය යෝජනා ක්‍රමවලට සහභාගී වීමට දිරිමත් කර ඇත.

සමෘද්ධි ප්‍රතිලාභීන් 'ඉලක්ක කිරීම' නිසා, මිනිසුන්ට ඔවුන්ගේ සීමිත හිමිකම් පිළිබඳව අතිශය අවිනිශ්චිත හැඟීමක් ඇති කරවන ක්‍රමය පුළුල් ලෙස අපයෝජනය කිරීමට හේතු වී ඇත. 'ලැයිස්තුවට ඇතුළත් කිරීම' අවශ්‍යතා පිළිබඳ අව්‍යාජ තක්සේරුවට වඩා දේශපාලන අනුග්‍රහය සහ දූෂිත භාවිතයන් සමඟ සම්බන්ධ වී ඇත. සමෘද්ධි නිලධාරීන්ට අත්තනෝමතික ලෙස සාමාජිකයින් තෝරා ගැනීමට සහ ඉවත් කිරීමට ඉඩ සලසා දීම තුළින් රජය විසින් වෙන් කරන ලද සංඛ්‍යාවට වඩා වැඩි නිවාස ප්‍රමාණයක් සෑම බල ප්‍රදේශයකටම අවශ්‍යව ඇත. ගෑස් සිලින්ඩරයක් හෝ යතුරුපැදියක් තිබීම , දරුවන් විවාහ වීම හෝ රැකියා සොයා වෙනත් ප්‍රදේශයකට සංක්‍රමණය වීම සාමාජිකයන් ලැයිස්තුවෙන් ඉවත් කිරීමට ප්‍රමාණවත් යැයි සැලකෙන හේතූන් ය.

බල ගතිකත්වයේ ප්‍රතිඵලයක් ලෙස, දිළිඳු හා අවදානමට ලක්විය හැකි මිනිසුන් හට සමෘද්ධි ගෙවීම් ලබා ගැනීමට දිගු කාලයක් රැඳී සිටීම, ප්‍රජා කටයුතු, ශ්‍රමදාන වලට හා දේශපාලන කටයුතුවලට බලහත්කාරයෙන් සහභාගී කරවීම, සමාජ පිළිගැනීමක් නොමැතිකම හෝ සමෘද්ධි නිලධාරියාට, ඔහුගේ සෙසු පරිපාලන නිලධාරීන්ට හෝ දේශපාලනඥයන්ට අගෞරව කිරීම යන හේතු මත මෙම ලැයිස්තුවෙන් ඉවත් කිරීම වැනි අමතර දුෂ්කරතා වලට ලක්වීමට සිදුවේ. සමෘද්ධි සාමාජිකයින්ට හිමිකම් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට හෝ ඉල්ලීම් කිරීමට ඇත්තේ ඉතා කුඩා ඉඩකඩකි.

**අර්බුදකාරී අවස්ථාවක් තුළ විශ්වීය සමාජ ආරක්ෂාව**

සහයෝගය ලබා දීම සඳහා වඩා හොඳ ඉලක්ක කිරීම සහ 'වඩාත්ම අවදානමට ලක්විය හැකි අය හඳුනා ගැනීම' සඳහා නවීන සංඛ්‍යාන ආකෘති සංවර්ධනය කිරීමට ආර්ථික විද්‍යාඥයින් විසින් යෝජනා කර ඇත. ආර්ථික අර්බුදයේ මහා පරිමාණ බලපෑම අනුව , ශ්‍රී ලංකාවේ නිවාසවලින් 70%කට (මාසිකව රුපියල් 65,000ක් සහ ඊට අඩු ආදායමක් ලබන අය) එදිනෙදා ජීවිතය ගැට ගසා ගැනීමට නොහැකි වනු ඇතැයි අපේක්ෂා කරන අතර, දැනට සමෘද්ධිය ගෙවන්නේ මිලියන 1.8කට පමණි. මෙම ගැඹුරු අර්බුදය තුළ කුටුම්භ ඉලක්ක කර ගැනීමේ ඕනෑම උත්සාහයක් අපේක්ෂිත ප්‍රතිඵලයට වඩා වෙනස් ප්‍රතිපලයක් ලබා දෙන හා වැරදි උපදෙස් සහිත සහ සමාජ නොසන්සුන්තාවයට තුඩු දීමක් වනු ඇත. එබැවින් අර්බුදයකදී ඵලදායි යාන්ත්‍රණයක් ලෙස භාවිතා කිරීමට නම් විශ්වීය වශයෙන් ක්‍රියාත්මක වන සමාජ ආරක්ෂණ වැඩසටහනක් තිබීම කාලීන අවශ්‍යතාවයකි. එසේ නොවුවහොත්, එය හොඳක් නැති, දැනටත් වියදම් දරා ඇති යමකට තවත් මුදල් වියදම් කිරීමක් පමණක් වනු ඇත.

දරිද්‍රතා රේඛා, ඔවුන්ගේ අත්තනෝමතික ස්වභාවයට අමතරව, මිනිසුන්ව ආර්ථික අභිමිවීම් කරා ගෙන යන බහුවිධ, චක්‍රීය හා සංකීර්ණ ක්‍රියාවලීන් ග්‍රහණය කර ගැනීමට අසමත් වේ. මෙය විශේෂයෙන්ම කාන්තාවන් සඳහා සත්‍ය වේ. සාර්ව මට්ටමේ ප්‍රතිපත්ති බොහෝ මිනිසුන් දරිද්‍රතාවයට තල්ලු කරන බව ද අර්බුදය හෙළිදරව් කර ඇත. එය “දුප්පතුන් සෙවීමේ” සිට එම ප්‍රතිපත්ති නිවැරදි කිරීම දෙසට බැල්ම යොමු කළ යුතු කාලය එළඹ ඇත. පවතින වැඩපිළිවෙල සමඟ සමෘද්ධිය දිළිඳුකම පිටුදැකීමේ මෙවලමක් ලෙස සැකසීමේ සිට එය සමාජ ආරක්ෂණ ප්‍රතිපාදනයක් ලෙස සංකල්පගත කිරීම දක්වා මාරුවීමක් අවශ්‍ය වේ. සමාජ ආරක්ෂණය යනු අයිතියක් වන අතර එය තෝරා බේරා ගත යුතු පුණ්‍ය කටයුත්තක් ලෙස හෝ විනය යාන්ත්‍රණයක් ලෙස නොසැලකිය යුතුය. 2017 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුව නව අයිතිවාසිකම් පනත් කෙටුම්පතට ආහාර සඳහා ඇති අයිතිය (ආහාර සුරක්ෂිතතාව සහ ආහාර ස්වෛරීභාවය), ජලය, නිවාස සහ සමාජ ආරක්ෂණය ද ඇතුළත් කළ යුතු බව නිර්දේශ කර තිබීම සිත්ගන්නා කරුණකි. . ආර්ථික අවපාතයක දී, ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා වන රාජ්‍ය ආයෝජන රජයේ සැලසුම්වලට කේන්ද්‍රීය ප්‍රතිචාරයක් විය යුතුය. කෙසේ වෙතත්, කලාපයේ අඩුම මුදල් ප්‍රමාණය, එනම් දළ දේශීය නිෂ්පාදිතයෙන් 1% කට වඩා අඩු මුදලක්, කොවිඩ්-19 වසංගතය තුළ ආර්ථිකයට සහාය වීම සඳහා වෙන් කර ඇති බව අපි දුටුවෙමු. දැනට අත්හිටවා ඇති රාජ්‍ය වියදම් විසින් සහල් සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ප්‍රවාහනය හා බෙදා හැරීම සඳහා පරිපාලන වියදම් වෙන් නොකිරීම වැනි රට තුළට ලබා දෙන ප්‍රමාණවත් නොවන ඉතා සුළු ආධාර යටපත් කර තිබේ. කෙටි කාලීනව, මතුවෙමින් ඇති සාගතය සැලකිල්ලට ගෙන, ආහාර ලබා ගැනීම සහ බෙදා හැරීම සඳහා මානුෂීය ආධාර සඳහා ප්‍රමුඛත්වය දීම අත්‍යවශ්‍ය වේ .

සාගතයක බලපෑම දිගුකාලීනය. එය අන්තර් පාරම්පරික පවා විය හැක. එම සෘණාත්මක ප්‍රතිඵල වලක්වා ගැනීම සඳහා කුටුම්භවල මූලික පෝෂණ අවශ්‍යතා සලකා බලා මූලික ආහාර ද්‍රව්‍ය පද්ධතියක් සමඟ මුදල් හුවමාරු ක්‍රමයක් ස්ථාපනය ද අවශ්‍ය වේ. සියලුම පාසල් සඳහා පෝෂ්‍යදායී දහවල් ආහාර ලබා දීමෙන් දරුවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහයෝගය සහතික කළ හැකි අතර ආහාර තෝරා ගැනීමට පවුල් සඳහා පෝෂණ උපදෙස් ද අවශ්‍ය වේ. තවද, කෘෂිකර්මාන්තය, ගොවිතැන සහ ධීවර කර්මාන්තය සඳහා ආධාර සහ ආයෝජනය සම්බන්ධයෙන් වන මධ්‍යකාලීන සිට දිගුකාලීන ආහාර සුරක්ෂිතතා පියවරයන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව සක්‍රීය කළ යුතුය.

අර්බුදයේ ගැඹුර අනුව, සමාජයේ සියලුම කොටස්වල පූර්ණ සහයෝගය බලමුලු ගැන්වීමකින් තොරව ආර්ථික ප්‍රකෘතියක් ඇති කළ නොහැකි බව පැහැදිලිය. මෙම සන්දර්භය තුළ, විසඳුමේ කොටසක් ලෙස පුළුල් සමාජ ආරක්ෂණ වැඩසටහනක් ඇතිකිරීම බරපතල ලෙස සලකා බැලිය යුතුය. විශ්වීය සමාජ ආරක්ෂණය ආර්ථික අර්බුදය විසඳීම සඳහා වැදගත් විසඳුමක් වන අතර එමඟින් රටට සිදුවන අවපාතයේ බරපතලකම අඩු කළ හැකිය. විශ්වීය

සමාජ ආරක්ෂණය, සංවර්ධන න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස හඳුනාගෙන දීර්ඝ කාලීන ප්‍රකෘතිමත් භාවයට සහ සංවර්ධනයට හා ඵලදායිතාවයට දායක වීමට, අසමානතාවයට ප්‍රතිචාර දැක්වීමට, ඇතුළත් වර්ධනය සහ සමාජ සාමය ශක්තිමත් කිරීමට දායක වේ.

අර්බුදකාරී අවස්ථාවක ප්‍රජාවන්ට එකට එක්වීමට හැකිවන පරිදි සමාජ ආරක්ෂණයට ප්‍රතිපත්තිමය රාමුව සැපයිය හැකි අතර, සම්පත් එක්රැස් කිරීමට සහ සුමට බෙදාහැරීම සහතික කිරීමට සෑම මට්ටමකම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් ශක්තිමත් කළ යුතුය. ආර්ථික ප්‍රකෘතිය කරා අපව ගෙන යාමටත් දේශපාලන ස්ථාවරත්වය තහවුරු කර ගැනීමටත් හැකි වන්නේ එවැනි දැක්මක් සැකසීමට හැකි සහ ජනතාව එයට පෙළඹවීම සඳහා ඔවුන් ඉදිරියේ නීත්‍යානුකූල භාවයක් ඇති දේශපාලන නායකත්වයකට පමණි .